# ප්‍රධාන කරුණු ලේඛනය (KFD)

## සාමාන්‍ය ඉතිරිකිරීම්, ලයිෆ් ලයින් සේවර්, මයි ප්ලෑන් සේවර්, ටාගට් ප්‍රොෆෙශනල් සේවර් සහා ළමා ඉතිරිකිරීම්

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී. එල්. සී.

COMMERCIAL
CREDIT

# ළමා ඉතිරිකිරීම්

| ප්‍රධාන ලක්ෂණ සහ ප්‍රතිලාභ | නිෂ්පාදනයේ ස්වභාවය සහ අදාළ නෛතික ප්‍රතිපාදන | පොලී අනුපාත සහ වෙනත් ගාස්තු | පහසුකම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය |
|---|---|---|---|
| ආකර්ශනීය පොලී අනුපාත<br><br>අවම තැන්පතුව රු.100/=<br><br>දරුවාගේ වයස අනුව ආකර්ශනීය ප්‍රසාද දීමනා යෝජනා ක්‍රම පිරිනමනු ලැබේ (වැඩි විස්තර සඳහා, පාරිභෝගිකයාට අපගේ ක්ෂණික ඇමතුම් අංකය ඇමතීම හෝ දිවයින පුරා ඕනෑම ශාඛාවකට පිවිසිය හැකිය)<br><br>ශේෂය තහවුරු කිරීමේ ලිපි සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.<br><br>සුදුසුකම් ලත් තැන්පතු වගකීම්, මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සමඟ රක්ෂණය කර ඇති අතර, එක් තැන්පත්කරුවෙකුට උපරිම වශයෙන් රු. 1,100,000 දක්වා වන්දි ලබා දෙනු ලැබේ. | - වයස අවුරුදු 18 ට අඩු දරුවන් සඳහා දෙමාපියන් හෝ භාරකරු සමඟ බාල වයස්කාර ගිණුම් විවෘත කෙරේ.<br><br>**පහත සඳහන් නීතිමය විධිවිධාන අදාළ වේ.**<br><br>-2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත<br><br>-2017 අංක 24 දරන දේශීය ආදායම් පනත<br><br>-වරින් වර නිකුත් කරන ලද CBSL මාර්ගෝපදේශ<br><br>- මූල්‍ය බුද්ධි අංශයේ උපදෙස්<br><br>- මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්ත විරෝධී මූල්‍යකරණ රෙගුලාසි | ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග මත පදනම්ව පොලී අනුපාත කලින් කලට සංශෝධනය කෙරේ. ඔබගේ යොමුව සඳහා වෙබ් අඩවියේ පොලී අනුපාත ඇමුණුම බලන්න.<br><br>ගිණුමක් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ගාස්තු අය නොකෙරේ.<br><br>වයස්-නිශ්චිත සීමාවන්ට අනුකූලව සෑම අවස්ථාවකම තැන්පතු සිදු කරන්නේ නම්, සුළු ප්‍රසාද දීමනා මුදල පාරිභෝගිකයාට සුදුසුකම් ලබයි. සහ පොලී අනුපාත ගණනය කරනු ලබන්නේ වර්තමාන ගිණුමේ ශේෂය මත පදනම්වය. | ගිණුමක් විවෘත කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට CCFP ශාඛා වෙත පිවිසිය හැකිය.<br><br>සමාගමේ AML සහ CFT ප්‍රතිපත්තියට අනුව සියලුම ගනුදෙනුකරුවන් පරීක්ෂා කර නිෂ්කාශනය කළ යුතුය.<br><br>අවශ්‍ය ලියකියවිලි<br><br>- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත<br><br>දරුවාගේ. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපත<br><br>- KYC සහ අවදානම් ඇගයීමේ පෝරමය.<br><br>- කොන්දේසි ලිපිය.<br><br>- දෙමාපියන්ගේ / භාරකරුගේ ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය (පිටපත) (විදේශ ගමන් බලපත්‍ර පිටපත වලංගු වන්නේ ද්විත්ව පුරවැසිභාවය දරන්නන් සඳහා පමණි)<br><br>- ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනය වත්මන් ලිපිනයට වඩා වෙනස් නම් බිල්පත් සාක්ෂි |

## ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත.

- දරුවාගේ සහතික කළ උප්පැන්න සහතිකයේ පිටපතක්.

- KYC සහ අවදානම් ඇගයීමේ පෝරමය.

- කොන්දේසි ලිපිය.

- දෙමාපියන්ගේ / භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය (පිටපත) (විදේශ ගමන් බලපත්‍ර පිටපත වලංගු වන්නේ ද්විත්ව පුරවැසිභාවය දරන්නන් සඳහා පමණි)

- ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනය වත්මන් ලිපිනයට වඩා වෙනස් නම් බිල්පත් සාක්ෂි.

<u>ප්‍රසාද දීමනා ගෙවීමේ කොන්දේසි</u>

ගිණුම් හිමියාට වයස අවුරුදු 18 වනතෙක් පමණක් ඉතිරිකිරීම් සඳහා ප්‍රසාද මුදලක් ගෙවනු ලැබේ.

<u>කලින් මුදල් ආපසු ගැනීමේ ප්‍රතිපත්තිය</u>

ගිණුම් හිමියාට වයස අවුරුදු 18 ට පෙර අරමුදල් ආපසු ලබා ගන්නේ නම්, මුල් තැන්පත් කළ මුදල සහ එම තැන්පතුව සඳහා උපචිත පොලිය පමණක් ගෙවනු ලැබේ.

# සාමාන්‍ය ඉතිරිකිරීම්, ලයිෆ් ලයින් සේවර්, මයි ප්ලෑන් සේවර්, ටාගට් ප්‍රොෆෙශනල් සේවර්

| ප්‍රධාන ලක්ෂණ සහ ප්‍රතිලාභ | නිෂ්පාදනයේ ස්වභාවය සහ අදාළ නෛතික ප්‍රතිපාදන | පොලී අනුපාත සහ වෙනත් ගාස්තු | පහසුකම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය |
|---|---|---|---|
| ආකර්ශනීය පොලී අනුපාත<br><br>ටාගට් ප්‍රොෆෙශනල් සේවර් සඳහා අවම තැන්පතුව රු.2,000/- කි.<br><br>සාමාන්‍ය ඉතිරිකිරීම්, ලයිෆ් ලයින් සේවර්, මයි ප්ලෑන් සේවර්,සඳහා අවම තැන්පතුවක් නොමැත.<br><br>ශේෂය තහවුරු කිරීම සඳහා කිසිදු ගාස්තුවක් නොමැත<br><br>සුදුසුකම් ලත් තැන්පතු වගකීම්, මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සමඟ රක්ෂණය කර ඇති අතර, එක් තැන්පත්කරුවෙකුට උපරිම රු. 1,100,000 දක්වා වන්දි ලබා දෙනු ලැබේ. | KYC සහ AML අවශ්‍යතා සපුරාලීමෙන් පසු පුද්ගලයින්ට හෝ නීත්‍යානුකූල පුද්ගලයින්ට ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කළ හැකිය.<br><br><u>නීතිමය රාමුව</u><br><br>● 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත<br>● 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත.<br>● වරින් වර නිකුත් කරන ලද CBSL මාර්ගෝපදේශ.<br>● මූල්‍ය බුද්ධි අංශයේ උපදෙස්<br>● මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදය මැඩපැවැත්වීම<br>● මේ වන විට පවතින වෙනත් නීති සහ කලින් කලට වරින් වර හඳුන්වා ලදන නව නීති. | ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත පදනම්ව ඉතුරුම් පොලී අනුපාත කලින් කලට සංශෝධනය කෙරේ.<br><br>ගිණුමක් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.<br><br>පහත සඳහන් කොන්දේසි සපුරාලන ඉතුරුම් ගිණුම් සඳහා මාසිකව රු. 100 ක අඩු කිරීමක් කරනු ලැබේ.<br><br>අවම ඉතුරුම් ගිණුම් ශේෂය රු. 999 ට අඩුනම්.<br><br><u>අක්‍රිය තත්ත්වය පිළිබඳ නිර්ණායක:</u><br>අඛණ්ඩව මාස හයක් (06) සඳහා පාරිභෝගිකයා විසින් තැන්පතුවක් හෝ මුදල් ආපසු ගැනීමක් වාර්තා වී නොමැතිනම්. | ගිණුමක් විවෘත කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට ළඟම ඇති CCFP ශාඛා වෙත පිවිසිය හැකිය.<br><br>සමාගමේ AMF සහ CFT ප්‍රතිපත්තියට අනුව සියලුම ගනුදෙනුකරුවන් පරීක්ෂා කර නිෂ්කාශනය කළ යුතුය.<br><br><u>තනි ගනුදෙනුකරුවන් සඳහා අවශ්‍ය ලියකියවිලි</u><br><br>- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත, KYC පෝරමය සහ අවදානම් ඇගයීමේ පෝරමය<br>- පාරිභෝගික හඳුනාගැනීමේ ලේඛන - (ජාතික හැඳුනුම්පත/වලංගු රියදුරු බලපත්‍රය/වලංගු විදේශ ගමන් බලපත්‍රය)<br>- ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනය වත්මන් ලිපිනයට වඩා වෙනස් නම් බිල්පත් සාක්ෂි.<br>- නියාමක/සමාගම් ප්‍රතිපත්තියට අනුව අවශ්‍ය වෙනත් ඕනෑම ලේඛනයක්/තොරතුරක්<br><br><u>නීතිමය ආයතන සඳහා අවශ්‍ය ලියකියවිලි</u><br>පුද්ගලයන් හැර අනෙකුත් සියලුම නීතිමය ආයතන CDD සහ KYC රෙගුලාසි සහ සමාගම් ප්‍රතිපත්තියේ අවශ්‍යතාවය මත පදනම්ව ලේඛන ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. |

## ප්‍රධාන නියමයන් සහ කොන්දේසි

වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙකු.

නේවාසික වීසා සහිත විදේශීය පුරවැසියන්ට / ද්විත්ව පුරවැසිභාවය ඇති අයට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ආයතනික, තනි හිමිකාරත්වයන්, හවුල්කාරිත්ව, සමාජ ශාලා, සමිති, පුණ්‍යායතන, සංගම්, රාජ්‍ය නොවන සංවිධාන සහ භාර මුදල් සඳහා ඉතිරිකිරීමේ ගිණුම් විවෘත කිරීමට අවසර ඇත.

ගිණුම් හිමියා විසින් පමණක් ඕනෑම ශාඛාවකින් මුදල් ආපසු ගැනීමට අවසර ඇත. තෙවන පාර්ශවීය මුදල් ආපසු ගැනීම් සඳහා අවසර නැත.

පොළිය දිනපතා ගණනය කරනු ලබන අතර මාසය අවසානයේ බැර කරනු ලැබේ.

ගිණුම විවෘත කරන අවස්ථාවේදී මූලික තැන්පතුව සමඟ පාස් පොත නොමිලේ නිකුත් කරනු ලැබේ

එකඟ වූ චක්‍රය අවසන් වූ පසු ප්‍රකාශය පාරිභෝගිකයාට තැපැල් කරනු ලැබේ.

<u>අක්‍රිය ගිණුම් ප්‍රතිපත්තිය</u>
-තැන්පතුවක හිමිකරු/නීත්‍යානුකූල හිමිකරු වසර දහයකට නොඅඩු කාලයක් සඳහා සමාගම සමඟ ගනුදෙනු කර නොමැති කිසිදු ලිපි හුවමාරුවක් කර නොමැති විට, අක්‍රිය තැන්පතුවක් ලෙස සලකනු ලැබේ.

-අත්හරින ලද / අක්‍රිය ඉතුරුම් රෙගුලාසි වලට අනුව සම්මත නීතිමය ක්‍රියා පටිපාටිය අනුගමනය කරනු ඇත.

## පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය

ඔබගේ ප්‍රතිචාර අප විශේෂයෙන්ම අගය කරන අතර අපගෙ  සේවාවන් පිරිනැමීමේදී ඔබගේ අපේක්ෂාවන් ඉටු කර ගැනීමට නොහැකි අවස්ථාවන් වලදී අපව දැනුවත් කරන්න.

අපගේ ප්‍රතිචාරයන් පිළිබඳ ඔබ තෘප්තිමත් නොවුණි නම් ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන් සේවාවෙන් සමාලෝචනයක් හෝ මැදිහත්වීමක් ඉල්ලා සිටිය හැක.

පාරිභෝගිකයින්ට අපගේ නිෂ්පාදන හෝ සේවාවන් පිළිබඳ පැමිණිලි කිරීම සඳහා පහත ක්‍රම භාවිතා කළ හැක

- අදාළ ස්ථානයේ ප්‍රධානියා ඇමතීම
- අපගේ දුරකතන අංකයට ඇමතීම +94 112 000 000
- ඊමේල් හරහා හෝ වෙබ් අඩවිය සහ වෙබ් චැට් හරහා ccl@cclk.lk or https://www.cclk.lk
- වට්ස්ඇප් මාර්ගයෙන් කෝල් සෙන්ටර් කළමනාකරුට පණිවිඩයක් යැවීම +94 76 517 1362
- ලිපියක් යැවීම ප්‍රධාන කාර්යාලය - අංක 106, යටිනුවර වීදිය, මහනුවර
- ආයතනික කාර්යාලය - අංක 165, කින්සි පාර, කොළඹ 08
- මූල්‍ය ඔම්බුඩ්ස්මන් 143 වජිර පාර, කොළඹ 05. +94 11 2 595 624
- ගනුදෙනුකරුවන්ට පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය පිළිබඳ වැඩිදුර තොරතුරු ආයතනික වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය

**අවසන් වරට සමාලෝචනය කරන ලද්දේ 2025 පෙබරවාරි 25**